# විමලරත්න කුමාරගමයන්ගේ කවියෙන් ප්‍රකට මානවත්වය

## The humanity revealed Wimalarathna Kumaragama's Poetry

කළුබෝවිටියන සෝරත හිමි

**Abstract**

A poet must be enriched with the necessary energy to see the society and human life realistically. Wimalaratne Kumaragama, a poet of the second generation of poets in Colombo, is also a poet who has a realistic quality of composition. He also wrote poems for the people. Kumaragama poet recognized the rhythm of the heart of the helpless people who were living bitterly and wrote rich verses with humanitarian intimacy. The poet Wimalaratne Kumaragama wrote poems with good discipline and self-restraint. His poems were not the experiences he got from the book, but the experiences he got from the book brought out the air. Although his works were written with deep devotion to humanity, its visible essence is a social reality, the socio-politics behind the lives of people who are suffering in the contemporary society. He grasped the crises delicately. He looked at the lives of the poor as well as the animals who are struggling for their lives with the kindness born. He also identified a hidden social aspect in it. Through that research, Wimalaratne Kumaragama brought out the way that Wimalaratne Kumaragama was engaged in poetry with human devotion, but thereby expressed the socio-political crises.

**Key words:-** Poem creations, Metaphor, Real time, Devotion, humanity

**සාරසංක්ෂේපය**

සමාජය සහ මිනිස් ජීවිතය යථාර්ථවාදීව දැකීමට අවශ්‍ය ශක්තිය කවියෙකු පොහොසත් කළ යුතුය. කොළඹ දෙවැනි කවි පරම්පරාවේ කවියකු වන විමලරත්න කුමාරගම ද යථාර්ථවාදී රචනා ගුණයකින් හෙබි කවියෙකි. ඔහු ජනතාව වෙනුවෙන් කවි ලිවීය. කටුක ජීවිතයක් ගත කරන අසරණ මිනිසුන්ගේ හදවතේ රිද්මය හඳුනාගත් කුමාරගම කවියා මානුෂීය ලෙන්ගතුකමෙන් පොහොසත් පදවැල් ලිව්වේය. විමලරත්න කුමාරගම කවියා හොඳ හික්මීමකින් සහ සංයමයකින් කවි ලියූ අතර ඔහුගේ කවි පොතෙන් ලද අත්දැකීම් නොව පරිසරයෙන් ලද අත්දැකීම් කවියට නැගූ අතර ඔහුගේ කෘති මනුෂ්‍යත්වය කෙරෙහි ගැඹුරු භක්තියකින් ලියා ඇතත්, එහි දෘශ්‍යමාන සාරය සමාජ යථාර්ථයකි. සමකාලීන සමාජයේ දුක් විඳින මිනිසුන්ගේ ජීවිත පිටුපස ඇති සමාජ, දේශපාලනය ආදී අර්බුද ඔහු සියුම් ලෙස ග්‍රහණය කර ගත්තේය. දුප්පතුන්ගේ මෙන්ම ජීවිතය වෙනුවෙන් අරගල කරන සතුන්ගේ ජීවිත දෙස ද ඔහු බැලුවේ උපන් කරුණාවෙනි. එහි සැඟවුණු සමාජ පැතිකඩක් ද ඔහු හඳුනා ගත්තේය. මෙම පර්යේෂණය හරහා විමලරත්න කුමාරගමයන් මානව භක්තියෙන් කාව්‍යකරණයේ නියැළුණු ආකාරය විමලරත්න කුමාරගමයන් මතු කළ නමුත් එමගින් සමාජ දේශපාලන අර්බුද ප්‍රකාශ කර ඇත.

**ප්‍රමුඛ පද**:- කාව්‍ය නිර්මාණ, රූපක, තත්කාලීන, භක්තිය, මානවත්වය

**ප්‍රවේශය**

කවියා සමාජ ශෝධකයෙකි. අපූර්ව වස්තු නිර්මාණක්ෂමා ප්‍රතිභාවෙන් යුතු කවියා මිනිස් දිවිපෙවත හා සම්බන්ධ සිදුවීමක්, අවස්ථාවක් හෝ අන් කවර දෙයක් වුවද සියුම් ලෙසත් සංකීර්ණ ලෙසත් වින්දනය කොට ජීවිතය සම්බන්ධ අලුත් අවබෝධයක් ලබාගනී. ඔහු එම අද්දැකීම තම වින්දන, චින්තන හා ලේඛන ශක්තිය එක් කරමින් සහානුභූතියක් බවට පරිවර්තනය කරයි. මේ නිසාම කවියා වූ කලී ලොව සුබ දුක්ඛාදී සංවේදනා හේතුවෙන් තම සිත්හි උපදින අනන්ත සිතිවිලි නිර්මාණාත්මකව සහෘදයා හමුවට ගෙන එන මැවුම්කරුවෙකි. කොළඹ යුගයේ දෙවන කවි පරපුර නියෝජනය කරන විමලරත්න කුමාරගම කවියාද සමාජයේ මානව ජීවිතය සියුම්ව

නිරීක්ෂණය කරමින් මානව භක්තියකින් යුතුව කවි නිර්මාණය කළ විද්වතෙකි. ඔහු සහ ඔහුගේ නිර්මාණ විමසීමට පෙර කොළඹ කවිය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් තැබීම උචිත යැයි හැඟේ.

කොළඹ යුගයේ ජ්‍යෙෂ්ඨ කවීන් ලෙස ප්‍රකට වන්නේ පියදාස සිරිසේන, ආනන්ද රාජකරුණා, ජී.එච්. පෙරේරා, එස්. මහින්ද හිමි, කුමාරතුංග මුනිදාස වැනි කවීහුය. ස්වභාව සෞන්දර්යය වර්ණනය, ජාතිකානුරාගී හැඟීම් මතු කිරීම වැනි තේමාවන් ඔවුන්ගේ නිර්මාණයන්ට වැඩි වශයෙන් දායක වූවාසේය.

කොළඹ දෙවන කවි පරපුර හෙවත් තරුණ කවීන් ලෙස ප්‍රකට වන්නේ චන්ද්‍රරත්න මානවසිංහ, මීමන ප්‍රේමතිලක, විමලරත්න කුමාරගම, සාගර පලන්සූරිය, එච්. එම් කුඩලිගම, මහගමසේකර, ගුණදාස අමරසේකර, ජී. බී සේනානායක, මහගමසේකර වැනි කවීහුය. මොවුහු පොදු ජනයාගේ ජීවන අද්දැකීම් බොහෝවිට කවිය සඳහා විෂය කරගත් බව පෙනේ. වස්තු විෂයෙහි පමණක් නොව ආකෘතිමය හා භාෂාමය ලෙසද සිංහල කවියේ නව ප්‍රවනතාවන් ඇති කිරීමට කොළඹ දෙවන පරපුරෙහි කවිය සමත් විය.

කොළඹ දෙවන කවි පරපුර නියෝජනය කරන විමලරත්න කුමාරගම කවියා මිනිසා විඳින අනේකවිද දුක් කම් කටොළු හා ඔවුන්ට නිරතුරුවම පැමිණෙන කරදර දෙස සානුකම්පිත දෘෂ්ටියකින් බැලූ විශිෂ්ට කවියෙකි. ඔහු ඈත පිටිසර වටපිටාවන්ගෙන් ලත් අද්දැකීම් ආත්ම සංයමයෙන් යුතුව ගෙනඑයි. මෙසේ මානව භක්තියකින් හා වින්දනාත්මක අවබෝධයකින් කවි ලියූ විමලරත්න කුමාරගමයන් ඒ හරහා තත්කාලීන සමාජ දේශපාලන ප්‍රස්තුතයන් දෙසද විචාරක්ෂය යොමුකළ ආකාරය ඔහුගේ පද්‍ය නිර්මාණ පිරික්සීමෙන් විෂද වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ විමලරත්න කුමාරයන් සමාජ සත්තාව ප්‍රකාශයෙහිලා තම කාව්‍ය ශක්තිය විශද කළ ආකාරය අධ්‍යනය කිරීමයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කිරීම මගින් තොරතුරු ඒකරාශී කිරීම පර්යේෂණයේ මූලික ක්‍රමවේදය වෙයි. ඒ අනුව මෙම පර්යේෂණය

ප්‍රාථමික මූලාශ්‍රය පරිශීලනය, ද්විතියික මූලාශ්‍රය පරිශීලනය, සඟරා හා අන්තර්ජාල පරිශීලනය යන ක්‍රමවේදයන් ඔස්සේ සිදුකොට ඇත.

**සාකච්ඡාව**

විමලරත්න කුමාරගමයන් වූ කලී මුහුකුරාගිය පරිකල්පනයෙන් හා ජීවිත පරිඥාණයකින් හෙබි කවියෙකි. තත්කාලීන බොහෝ කවීන්ට විෂය නොවූ අද්දැකීම් ස්වකීය කාව්‍ය රචනා හරහා මතු කිරීමට ඔහු සමර්ථ වූහ. වියළි කලාපයේ විවිධ දුෂ්කරතාවන් හමුවේ අසරණ ලෙස ජීවිකාව ගෙනයන මිනිසුන්ගේ ශෝකාලාපය ඔහු මතු කළේය. වන්නියේ ජීවිතය ඔහුගේ කවීත්වය පිළිබඳ ස්වර්ණමය යුගයකි. පොදු ජනයාගේ වේදනාවන් හමුවේ උණුවන හදවතක් ඇති ඔහු ඒවා දෙස සානුකම්පිතවූත් විචාරාත්මක ඇසකින් බැලීය. ඔහුගේ 'රතුකැට' නම් නිර්මාණය තත්කාලීන සමාජ දේශපාලන අර්බුදයක් මතුකරන ප්‍රබල නිර්මාණයකි. ගම් වැසියන්ගේ දුගී දුප්පත් ජීවන රටාව මතුකරන මෙම නිර්මාණය පාලක පන්තියේ නෙත් විවර කිරීමට කරන ආයාචනයක් බඳුය.

''වහළට සෙවන මානා බේරු    බටකොළ
වැරැණිය කෝටු නිරුවත් බිතුය    වටකළ
ලෙබිමයි ඇඳයි මහ වැහි පොකුරු    වටවළ
නොදුටිම් මෙවැනි තතු මා හිටිය    රටවළ''

(සිරිවර්ධන, 1987ඃ 200).

කවියා තුළ ඇතිවන සංවේගය සමඟ සමාජ සත්‍යාවක් මතු කරයි. පාලකයින්ගේ දැඩි අවධානය යොමුවිය යුතු පැතිකඩක් මතු කරයි. ඈත දුෂ්කර ගම්වල මිනිසුන්ගේ දුක්ඛ අඳෝනා යස ඉසුරින් පිරි නගරයේ වෙසෙන ධනපති පාලකයන්ට නොඇසෙයි. මෙම කවි පන්තිය හරහා කුමාරගම කවියා ගැමියාගේ අනන්ත දුක්ඛ දෝමනස්සයන් මතු කරන අතර එවැනි ප්‍රස්තුතයන් පිළිබඳ පාලක පක්ෂයේද අවධානය යොමු කරවයි.

කුමාරගමගේ 'විවාසිතව' නම් නිර්මාණය මගින්ද මතුවන සමාජ යථාර්ථයකි. කවියා මරණයට පත්වීමට පෙර වන්නි වැසියා වෙනුවෙන් ප්‍රාර්ථනාවක් සිදු කරයි. සාගත වසන්ගතයන්ගෙන් දුක්

විදින වන්නියේ ජනයා ඉන් මුදවා ගැනීම කවියාගේ අභිප්‍රායයි.

''සාගත වසන්ගත හැම මග හැරීයන්
මහටම වගේ යලටත් වැව් පිරීයන්
හැම දියුණුවම පිළිබඳ කිරි තිරීයන
වන්නිය වෙනස් වූදා මා මැරීයන්''
(පෙරේරා, 1963: 160).

කවියාගේ ප්‍රාර්ථනය අවිහිංසකය. එහෙත් කවියෙන් මතුකරන සමාජ දෘෂ්ටිය ගැඹුරුය. වන්නියේ ජනතාවගේ මෙම ආපදාවන් පිළිබඳ වගකිවයුතු පිරිසක් ඇත. නිදිගත් ඔවුන් අවදි කිරීම කවියාගේ අරමුණ වූ බව පෙනෙයි. 'මහ වැව් පොකුණු වන්නිය තුළ තැනීයන්' වැනි කාව්‍ය පද හරහා කවියා අමතන්නේ පාලක පක්ෂයටය. 'මේ හඬ අයියනායක හට ඇසීයන්' ලෙස කවියා අදෘශ්‍යමාන අභෞතික බලවේගවල පිහිට පතන්නේ ජීවමාන දේශපාලන බලවතුන් සියුම් උපහාසයට ලක් කරමිනි. මෙසේ කුමාරගමයෝ අසරණ ගැමියාගේ සිනහවත් කඳුලත් මැනවින් අවබෝධ කරගෙන මිනිස් පාරිශුද්ධියට අවැසි ශක්තිය කවිය හරහා ගොඩනැගූහ.

කුමාරගමයන් ධනපති බලකාමී සමාජයේ අර්ථශූන්‍ය ජීවන රටාව දැඩි දෝෂදර්ශනයට ලක් කරන අතර පැල්පත තුළ ඇති සහජීවනය මුතු මැණික් හා සමාන වටිනාකමකින් දකියි. 'කළවානෙදී' නම් පැදි පෙළ හරහා මතු කරන්නේ එවැනි සමාජ සත්‍යාවකි.

''ඇති අය කිසිම අඩුවක් නැත ඉහළපෙළේ
නිවහන් ළඟය නැතිබැරි අය නිතරමළේ
හැමදෙන සොයන මුත් ඇලබඩ පොළොව දොළේ
මේ රට මැණික් ඇත බට කොළ හෙවුණු පැලේ''
(සිරිවර්ධන 1987: 193).

උක්ත කවෙන් කවියා පෙන්වන්නට උත්සුක වන දර්ශනයක් ස්මතු වී පෙනෙයි. ඇති හැකි පක්ෂය හමුවේ නැති බැරි අසරණයින්ගේ බේදජනක ඉරණම ඉන් ධ්වනිත කළාසේය. සමාජයේ ඇති නැති පරතරය මත ජීවිත කාලය පුරාවට කඳුළු වගුරුවන අසරණ ජනයාගේ ශෝකාලාපය පැවසිය හැකි කෙනෙක් නොමැතිසේය.

''ඩාදිය පොකුරු සැඟවී ත් පොළොවෙ පසේ
නොගැඹුරු සොහොන්වල හඬ මට නිතර ඇසේ''
(පෙරේරා, 1963ඃ 160).

දුප්පත් ජනයාගේ දුක දකින්නේ මියගිය ඔවුන්ගේම සහෘදයින් පමණකි. ඔවුන් හඬගා යමක් ප්‍රකාශ කරයි. එහෙත් ඔවුන්ගේ අවනඩුව අසන්නට කෙනෙක් මිහිපිට නොමැත. කුමාරගම කවියා තත්කාලීන බලය හිමි පන්තියට තියුණු විවේචනාත්මක පහරක් එල්ල කළ අවස්ථාවකි. මෙම නිර්මාණය හුදෙක් ගැමි දුප්පත් ජන ජීවිතයේ දුක්ඛිත පක්ෂය පිළිබඳව කෙරුණු බොල් ප්‍රකාශයක් නොවේ. එහි ඛේදජනක අද්දැකීම් හා ජීවන රටාව හදවතින් ස්පර්ශ කරමින් ලත් පරිඥාණය හඟවන අව්‍යාජ කාව්‍ය නිර්මාණයකි. ධනය, බලය මිනිසාට ළඟා වෙත්ම ආධ්‍යාත්මික ගුණධර්මයන් ඔහු කෙරෙන් පලායන බවත් ගුණවත්කම තවමත් රැඳී පවතිනුයේ පැල්පතේ බවත් කවියා ප්‍රකාශ කර සිටී. 'දිමුතුමුතු' කවි පෙළෙහි පහත කවිය ඊට හොඳම නිදසුනකි.

''දින දින දියුණුවන විට මිනිසුන්ගෙ මොළේ
ධන රැස් කිරීමෙන් ළංකර ගනිති බලේ
වෙන දේ කීවොත් මෙහි මගෙ කවි රසය තැලේ
ගුණවත්කම තිබෙනුයේ අසරණම පැලේ''
(පෙරේරා, 1963ඃ 160).

කවියා ව්‍යංගාර්ථයෙන් යමක් ප්‍රකාශ කරයි. විද්‍යමාන වාච්‍යාර්ථයට වඩා ධ්වනිතාර්ථය ගරුකොට එමගින් සාහිත්‍යය රසය කුළු ගැන්වීමෙහි විශේෂ සක්‍යතාවක් කුමාරගම කවියා සතු වූ බව පෙනෙයි. ධනය හා බලය හරහා ඉහළට යන මිනිසාගේ කුහක ගති පැවතුම් කවියාගේ දැඩි දෝෂ දර්ශනයට ලක්වෙයි.

විමලරත්න කුමාරගම ශූරීන්ගේ තවත් කෘතහස්ථ නිර්මාණයකි 'අසරණ ගැහැණිය' නම් කවි පන්තිය. වෙසඟනකගේ අඳුරු සමාජ පැතිකඩක් ස්පර්ශ කරන මෙම නිර්මාණය පාඨක සිත් කම්පා කිරීමට සමත් වේ.

මළ ජාතියක් සතු ජාතික කොඩිය වගේ
මුහුණක් ඇතිව යන මහ වීදියක් දිගේ
අසරණ ගැහැණියකි රළු වැරහැලිය ඇගේ
කණගාටුයි බලන්නට දරු දෙදන ඇගේ
(වෙත්තමුනි, 1991: 03).

සමාජය විසින්ම නිර්මාණය කරන වෙසඟන නම් චරිතය සමාජයෙන් ව්‍යුක්ත කර දැක්වීමට තරම් මිනිසුන් රළු වී ඇතිබව කුමාරගම කවියා ව්‍යංගයෙන් මතු කරයි. ඇයගේ ජීවන චරිතය කවියා මතු කරන්නේ කවි ඇසකට පමණක්ම හසුවන සමාජ සත්‍යාවක් ලෙසය.

''සම් ඇට නමුත් නැති මස් කළඳකුදු රැඳී
අත ඇති බිළිඳු මළ සිරුරක් විලස නිදී''
(වෙත්තමුනි, 1991: 03).

කවියා ඇය වරදකාරියක ලෙස නොදකියි. ඇය මෙතරම් අසරණ වූයේ සමාජයේ වරදිනි. 'දනපති කුහකයන්ගේ මන්දිර ඔස්සේ' වැනි කාව්‍යෝක්ති මගින් කවියා තත් අසාධාරණ ජන සමාජය දැඩි විවේචනයට ලක් කරයි. මෙසේ කුමාරගම කවියා මානව භක්තියකින් කාව්‍යකරණයේ යෙදුණ නමුත් ඒ හරහා සමකාලීන සාමාජීය අර්බුදයන්ද සියුම් ලෙස ග්‍රහණයට හසු කරගත් බව පෙනෙයි.

විමලරත්න කුමාරගමයන්ගේ කාව්‍ය දෘෂ්ටි පථයට වඩාත් යොමුවූයේ රාජ රාජ මහාමාත්‍යාදීන් නොවේ. ඔහු දිළිඳු ගැමි ජන සමාජය දෙස දයාවෙන් නෙත් හෙළීය. ඔහුගේ කරුණාවට ලක් වූ තවත් පිරිසක් වන්නේ වනචාරී සත්ත්වයන්ය. අවාසනාවන්ත ඉරණමකට හසුව මියයන සතුන් ඔහුගේ දයානුකම්පාව හිමිකරගන්නා සේම ඊට අනුබල දුන් හා වග කිවයුතු පිරිසද දෝෂ දර්ශනයට ලක් කරයි. කැටවළ, සිරගෙය, යන්තම් බේරුණා, කිරා වැනි ඔහුගේ බොහෝ නිර්මාණ හරහා එය ධ්වනිත වේ.

'කැටවළ' නිර්මාණය කවියගේ පෞද්ගලික අද්දැකීමක් සහනුභූතියක් බවට පත් කරන්නකි. සිත් කලකිරවන ශෝකාර්ථයක් ඇති එම නිර්මාණය ශෝකාකුල ස්වරයෙන් කවියා ගෙන එයි. ඔහු

විනෝදයට මෙන් යහළුවන් සමඟ දඩයමේ ගොස් සිදුවූ පුවතක් පද්‍ය පන්තියට වස්තුවිෂය වේ. වෙඩි පහරට ලක්වන්නේ පැටවුන් දෙදෙනෙකු ඇති වැළහින්නකටය.

''වම් ඉළයට වැටී ගති ඒ වැළහින්න
මම කෑ ගැසිමි කඩියට වෙඩි නොතියන්න
දඟලන අතර ඈ තැතිගෙන නැගිටින්න
දුක්මුසු ලෙසින් හැඬුවා පොඩි දරු දෙන්න''
(රණසිංහ, 1995: 37).

දඩයම් මානසිකත්‍වයෙන් එහි ගිය කවියා ලද අද්දැකීමෙන් කම්පා වේ. සියලු සත්ත්වයන් පිළිබඳ දයානුකම්පාවෙන් හදවත උතුරායන කවියා මානව සංහතියම තම නෑයන් ලෙස දකියි. 'දරුපෙම් මරන්නට ඒ මවට එය මදි' යන පද්‍ය පාඨයෙන් මතුවන්නේ මාතෘ ස්නේහය නම් වූ ආධ්‍යාත්මික සංකල්පය බාහිර වෙඩි උණ්ඩයකින් නැසිය නොහැකි බවයි. මෙමගින් මාතෘ හා දාරක ප්‍රේමයේ අවියෝජනීය සබඳතාව උත්තම කොට දක්වන අතර උපන් විගස බිළිඳුන් තිඹිරි ගෙයිහිම මරා දමන, මහමග දමායන පාපී මිනිස් සමාජයට තිරිසන් සමාජයෙන් ප්‍රබල උපදේශයක්ද ලබාදෙයි. එසේම සමකාලීන සමාජයේ දේශපාලන නීති පද්දතීන් කඩ කරමින් සිදුවන නිමක් නොවන සත්ත්ව ඝාතනය පිළිබඳ අර්බුදයක්ද මෙම නිර්මාණය හරහා මතුව පෙනෙයි.

කුමාරගමයන්ගේ 'සිරගෙය' නිර්මාණය තුළින් මතු කරන්නේ නියං කාලයේ දිය බොන්නට ගොස් වළක වැටී සතියක් දුක් විඳිමින් මරණයට පත් ඇතින්නියකගේ ඛේදවාචක කතා පුවතකි.

''නුග අතු ඇහැටු දළු ගෙළු එන විටදි ළඟා
එලවා ගනී වියරුව පැන සොඬය නගා
හත් දවසක්ම මේ දුක්මුසු රැඟුම රඟා
ඈ බැරි තැන වුණා ඒ වළ තුළම දිගා''
(රණසිංහ, 1993: 05).

කවියා ඇගේ මරණයෙන් සංවේගයට පත් වෙයි. මෙම නිර්මාණය හරහා මතුවන තවත් සමාජ යථාර්ථයකි. ඇතැම් දැවැන්ත

බලවතුන් කෙතරම් ඛේදජනක ඉරණමකට ලක් වූවත් අන්‍යයන්ගේ පිහිට පිළිකුල් කරයි. එහෙත් කවියා ප්‍රකාශ කරන්නේ මෙවැනි අනපේක්ෂිත කරදර මඟහැර කිසිවකුට ජීවත් විය නොහැකි බවයි. මෙවැනි නිර්මාණ හරහා කුමාරගම කවියා සුන්දර වන සතුන්ගේ ජීවිතවලට එල්ලවන හිංසාකාරී සිද්ධීන් තුළින් කම්පාවට පත්වූ බව පෙනෙයි. එහෙත් ඔහු එම සිද්ධීන් වැළඳ ගන්නේ එහි මතුපිට පෙනෙන භයංකාරය හෝ දුක්ඛදායකත්වයෙන් ඔබ්බට ගිය පුළුල් අර්ථයකිනි. ඒවායේ සෙනෙහස, හුදකලාව, මාතෘ ප්‍රේමය, අනියත භාවය, ආධිපත්‍යය බිඳ වැටීම වැනි ප්‍රස්තුතයන් ඔහුගේ නෙත ගැටුණි. තිරිසන් සතුන් මුහුණපාන එම අද්දැකීම් සමස්ත මිනිස් සංහතියට වුව අනපේක්ෂිත ලෙස පැමිණෙන සමාජ අර්බුදයන් බව ඉන් මතු කරයි.

සිංහල ජනයා පුරාණයේ සිටම ස්වභාවික වස්තූන් දේවත්ව ආරෝපණයෙහිලා සලකමින් බියමුසු භක්තියකින් පුදපූජා පැවැත්වූහ. කුමාරගමයන්ගේ 'අයියනායක' පද්‍ය පන්තිය හරහා මතු කරන්නේද එවැන්නකි. ''නිර්දය පරිසරයත් ඒ පරිසරයට හසුවන ගැමියන් අනාථයන් මෙන් සිත කය දෙකින් තැලී මිරිකී සකස්වන සැටිත් 'අයියනායක' පද්‍යාවලියෙහි මුල සිට අවසානය දක්වා ඇති පද්‍යයන්ගෙන් වර්ණනා වෙයි.''(වික්‍රමසිංහ, 1957: 71).

''සාගත වසංගත හා එන නියඟ වලින්
සහනය පතා වන දෙවියන් ළඟට කෙලින්
එන මේ පිරිස සැරසීමට නුවණ මලින්
පෙළඹෙන අයට අනුකම්පා කරම් මුලින්''
(සිරිවර්ධන, 1987: 164).

සාගත වසංගත වලට නිරතුරුව හසුවන ජනතාවගේ දුක පැවසීමට බලධාරියෙක් නොමැත. ඔවුන්ගේ සහනය අදෘෂ්‍යමාන දෙවියන්ය. කුමාරගමයන් සංකීර්ණ සමාජ අර්බුදයක් සංයමයෙන් මතුකළ අවස්ථාවකි.

ඉතා සරල සිද්ධියක් ඇසුරෙන් ගැඹුරු වින්දනයක් මෙන්ම පුළුල් ජීවන සත්‍යයක් මතුකරන අයුරින් ලියූ 'හපුමලී' නම් පද්‍ය නිර්මාණය කුමාරගමයන්ගේ අපූර්ව පැදි පෙළකි. හපුමලී නම් දුප්පත් අසරණ කත ගමරාළ නිසා දූෂණයට ලක්වෙයි. ධනපති පන්තිය

විසින් නිර්ධන පන්තිය පාගා දැමීමක් ලෙස මෙන්ම අවිහිංසක ගැමි තරුණියකට සිදුවූ ලිංගික සූරාකෑමක් පිළිබඳවද පද්‍ය පන්තිය අවධානය යොමු කරයි.

''ගමේ රාළ මහ බලවත් කෙනෙකු නිසා
මුළු ගම සිටී නිහඬව අව නඩුද අසා
ඔහු අසතුටු කරපු අය හිර ගෙයක වසා
පසුවිය යුතුය කළු ගල කට පහර ගසා''
(රාජකරුණා, 2004: 110).

තත්කාලීන සමාජ අර්බුදයක් මතුකළ අවස්ථාවකි. දේශපාලන බලය හා ආර්ථික ශක්තිය ඇත්තවුන් නිර්ධන ජන සමාජය තම අවශ්‍යතාවන්ට අභිමත සේ යොදාගත් අයුරුත් එයට විරුද්ධවූවන්ට සිදුවන ඛේදජනක ඉරණමත් මින් ධ්වනිත කරයි. ගමේරාළ නම් ධනපති සමාජයේ ගොදුරක් වන හපුමලී පිළිබඳව සංවේගයට පත් කවියා සමාජය ඉදිරියේ ප්‍රශ්නයක් තබයි.

''රවටා මුළා කොට දී හැට්ටය රෙද්ද
ඔබ වැනි මඟුට යැව් අය කොපමණ ඇද්ද
කුමරියේ ඔබේ අත පාපය නැති සුද්ද
අල්වා ගන්ට මේ ලොව කිසිවෙක් ඇද්ද''
(රාජකරුණා, 2004: 110).

කවියා කුහක ගති ඇති බලවත් සමාජයෙන් අසන්නේ මෙසේ විපිළිසරණව අසරණ වූ තැනැත්තියන්ට පිහිට වීමට කිසිවෙක් හෝ ලොව සිටින්නේද යන පැනයයි. කාලීන සමාජයේ කාන්තාවට සිදු වූ ප්‍රභල අසාධාරණයන් මතු කළ අවස්ථාවකි.

'උපතින් නොව යමෙක් ක්‍රියාව මත වසලයෙකු හෝ ආර්යයකු බවට පත් වේ' යන රුවන් වැකිය සනාථ කෙරෙන කුමාරගමයන්ගේ නිර්මාණයකි 'හේරත්හාමි' පද්‍ය පන්තිය. හේරත්හාමිගේ රැකියාව වූයේ මළමිනී කැපීමය. කවියා හේරත්හාමි තුළ ඇති ආධ්‍යාත්මික පාරිශුද්ධිය මතු කරයි.

''ගොවි කම්කරු රදළ උඩරට කිසිම කුලේ
වෙන කිසි කෙනෙක් තව නැත මේ වැඩය කළේ
දැනගන්නට කිසිඳු වරදක් නොමැත මොළේ
කිසි අනතුරක් නොකරයි කිසිවකුට කැලේ''
(සිරිවර්ධන, 1987: 148).

බෝසත් ගුණාංග ඇති හේරත්හාමි උතුම් මානුෂීය ගුණාංග යන්ගෙන් පොහොසත්ය. කවියේ මුල් පේළි දෙකෙන් කවියා වැදගත් සමාජ විවරණයක් සිදු කරයි. කුල මානයෙන් උඩඟු වූවෝ පහත් කුලවල ඇත්තන් දකින්නේ ඔවුන්ගේ කුදු මහත් අවශ්‍යතාවන් පිරිමැසීමට උපන් පිරිසක් ලෙසය. එය අද පවතින තත්ත්වයටද වඩා තත්කාලීන සමාජයේ මුල් බැසගත් සංකල්පයකි. ජීවිතයේ අනිත්‍යතාව අද්දැකීමෙන්ම අවබෝධ කරගත් හේරත්හාමි මානව සමාජයේ හමුවන දුර්ලභ මනුෂ්‍යයෙකි. ඔහු තම නැගණියගේද මළ සිරුර කපයි. එය විශ්ව යථාර්ථය අවබෝධ වූ ඔහුට තවත් එක් මළ සිරුරක් පමණකි. එහෙත් සමාජය විසින් ඔහුට අවලාද අපවාද නගයි. යම් සමාජගත චරිතයක උදාර ගුණ පැවතුම් අවබෝධ නොකරගන්නා සමාජය ඔහුට නින්දා අපහාස නගයි. හේරත්හාමි කවි පන්තිය හරහා කුමාරගම කවියා එබඳු සමාජ සිද්ධාන්තයක්ද මතු කරයි.

කුමාරගම කවියා විසින් රචිත 'ජරස් බරස්' නිර්මාණය සමාජ පන්ති තුනක ක්‍රියාකලාපය සරළ සිදුවීමක් හරහා මතු කරන නිර්මාණයකි.

''රෑ මුරයයි පොලීසියේ රාළහාමි ඇවිදිනවා
ජරස් ! බරස් ! ජරස් ! බරස් !'' (සිරිවර්ධන, 1987: 148).

කවියා උක්ත කාව්‍යෝක්තියෙන් මතු කරන්නේ මධ්‍යම පාන්තික සමාජයයි. 'ජරස් ! බරස් !' වැනි යෙදුම් මගින් පොලිස් රාළහාමිගේ බොල් අහංකාරය පෙන්වන්නාසේය. නමුත් ඔහු නිදි වර්ජිතව ඇවිදින්නේ තම ජීවය සවිකර ගැනීමටය. මෙසේ ආරූඪකරගත් අහංකාරය නිසා බඩගින්නේ ලතැවෙන සිඟන ජනයා ඔහුගේ නෙත නොගැටෙයි.

''කුඩා කෙල්ල මහපාරේ
බඩගින්නේ ළතැවෙනවා''(සිරිවර්ධන, 1987: 148).

තවත් සමාජ ස්ථරයකි. ඇය කුසගින්න නිවා ගැනීමේ අරගලයක යෙදෙන තැනැත්තියකි. ඇයගේ මෙම මොරදීම රාත්‍රිය පුරා ඇවිදින මධ්‍යම පාන්තික පොලිස් බටයාට හෝ මාර්ගයේ පිස්සන් සේ දිවයන කාර් වලට නොපෙනෙයි.

''මොටෝ කාර් මහ පාරේ
පිස්සන් මෙන් දිව යනවා''(සිරිවර්ධන, 1987: 284).

කවියා උපහාසයෙන් 'පිස්සන්' ලෙස අමතන්නේ ධනපති පන්තියටය. ඔවුනට නිදි වර්ජිතව රැය පුරා ඇවිදින රාළහාමි හෝ කුසගින්නේ පසුවන හිඟන කාන්තාව නොපෙනෙයි. පන්ති විෂමතාවය මතු කරන ප්‍රභල අවස්ථාවකි. එකම සමාජයක එකට යා නොවෙන පන්ති තුනක සංකීර්ණ මිනිස් හැසිරීම් මතු කරන මෙම පැදි පෙළ සමකාලීන සමාජ ව්‍යුහයේ ඛේදජනක පැතිකඩක් නිරූපණය කරයි.

මෙසේ විමලරත්න කුමාරගම කවියා මානව භක්තියකින් පද්‍යකරණයේ යෙදුණ නමුත් බොහෝ නිර්මාණ හරහා සමකාලීන සමාජ දේශපාලන අර්බුදයන්ද සියුම් ලෙස මතුකළ බව පැහැදිළිය.

**සමාලෝචනය**

මනුෂ්‍ය ජීවිතය හා පරිසරයෙහි ආධ්‍යාත්මික නෑ සබඳකම් සියුම් නිරීක්ෂණ කෞෂල්‍යයකින් දැකීමේ සක්‍යතාවක් විමලරත්න කුමාරගම කවියා සතු බව අතිශයෝක්තියක් නොවේ. උචිතානුචිත විවේක බුද්ධියෙන් මානව සමාජය දෙස විචාරක්ෂයෙන් බැලූ හෙතෙම තත් සමාජීය සත්‍යාවන් තැම්පත් නුවණින් කවියට නැගීය. අසරණ වූ මිනිස් හා සත්ත්ව ජීවිත දෙස දයානුකම්පාවෙන් බැලූ කුමාරග මයන් ඔවුන්ට සිදුවී ඇති දුක්ඛ දෝමනස්සයන් හා අසාධාරණකම් මුහුකුරාගිය නුවණින් හා මානව භක්තියෙන් කවියට නැගීය.

රතුකැට, විවාසිතව, කළවානෙදි, දිමුතුමුතු වැනි නිර්මාණ හරහා මතුවන්නේ ගම් නියම්ගම්වල පීඩිත ලෙස කල් ගෙවන

මානව සංහතියේ අඳුරු ජීවන රටාවන්ය. එම පද්‍ය නිර්මාණ හරහා කවියා තත්කාලීන දේශපාලන හා සමාජ අර්බුද රැසක් මතු කරයි. කුමාරගමයන්ගේ අසරණ ගැහැණිය, හපුමලී වැනි පද්‍ය පන්ති හරහා මතුවන්නේ නිර්ධන පාන්තික තරුණියන්ට ධනපති පන්තියෙන් සිදුවන ලිංගික සූරාකෑම් පිළිබඳ ඛේදජනක සමාජ සත්‍යාවකි. කැටවල, සිරගෙය, යන්තම් බේරුණා, කිරා වැනි නිර්මාණ හරහා ඔහු සත්ත්ව ලෝකයට දයාව කරුණාව දක්වයි. එහිදී තිරිසන් සමාජයෙන් මනුෂ්‍ය සමාජයට ගතහැකි ආදර්ශ පිළිබඳ කතිකාවතක් ගොඩනගයි. එසේම තත් සිද්ධීන් හරහා සමකාලීන සමාජ ගැටළුද විවරණය කළේය. හේරත්හාමි වැනි නිර්මාණ මගින් කුල හීනයන් ලෙස කොටුකළ සමාජ රාමුවක අවලාද අපවාදයනට හසුවන බෝසත් ගුණෝපේත මිනිසුන් පිළිබඳ විවරණය කරයි. අයියනායක වැනි පද්‍ය නිර්මාණ මගින් නූගත් ගැමියන්ගේ අන්ධ භක්තිය දෙස සානුකම්පිකව බලන කවියා තත් සමාජයේ ධනපති පන්තිය ව්‍යංගාර්ථයෙන් විවේචනය කරයි. ජරස් බරස් වැනි පද්‍ය පන්ති හරහා ඇතිනැති පරතරය මත පන්ති ගැසුණු සමාජයේ මනුෂ්‍ය ධර්මයන් වැළලියන ස්වභාවය මතු කරයි. මෙසේ විමලරත්න කුමාරගම කවියාගේ කාව්‍ය දෘෂ්ටි පථයට හසු වූ සංකීර්ණ සමාජ ධාරණාවන් මානව භක්තියකින් මෙන්ම එහි ගැබ් වූ සමාජ දේශපාලනික අර්බුදයන් ද මතු කරමින් ගෙන ආ බව පැහැදිළිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ද්විතීයික මූලාශ්‍රය

අබේසිංහ, දීපචන්දි. (2001). සිරිගුණසිංහ සහ නූතන සිංහල කාව්‍යය. කොළඹ 10: ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

අබේසිංහ ඩබ්ලිව්, ඒ. (1991). කවිය ගීතය හා සමාජය. කොළඹ 10: ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

අල්විස් පෙරේරා, පී, බී. විමලරත්න කුමාරගම. (1963). කේ. කේ. පුංචිබණ්ඩා ප්‍රකාශනයකි.

ගුණසේකර, බන්දුසේන. (2005). නූතන සිංහල කවිය විචාරය හා රසාස්වාදය. කොළඹ 10: ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

ධම්මින්ද හිමි, අගුලුගහ. (1991). සිංහල කාව්‍යයේ නව ප්‍රවනතා. කර්තෘ ප්‍රකාශන.

රාජකරුණා, ආරිය. (2004). නූතන සිංහල කාව්‍යය 02. කොළඹ 10: ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

වික්‍රමසිංහ, මාර්ටින්. (1957). නව පද්‍ය සිංහලය. රාජගිරිය: සරසි සමාගම.

විජේසූරිය, සරත්. (2007). නව කවි අධ්‍යයනය. බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

සුරවීර ඒ, වී. (1982). සමාජීය සාහිත්‍ය අධ්‍යනය. සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්මන්ට් සමාගම.

## තෘතීයික මූලාශ්‍රය

කරුණාරත්න, කුසුමා. (සංස්.) (1992). නව කවි සංග්‍රහය. බොරලැස්ගමුව: ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

ගුණසේකර, බන්දුසේන. (1998) ''සම්ප්‍රදාය හා සිංහල කවිය'' ජී. එම්. සේනාරත්න. (සංස්.) සම්භාව්‍ය විචාර ලිපි සරණිය, කොළඹ 10: ඇස්. ගොඩගේ ප්‍රකාශකයෝ.

රණසිංහ ඩබ්ලිව්, එච්, පී. (සංස්.) (1995). නූතන පද්‍ය සංග්‍රහය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රණසිංහ ඩබ්ලිව්, එච්, පී. (සංස්.) (1993). සිංහල පළමුවන පොත මූලික පිරිවෙන. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වෙත්තමුනි, විජයසිරි. (සංස්.) (1991). දේශයට ජීවය දුන් පනස්වෙනි දශකයේ කවි සඟරා. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

සිරිවර්ධන, සුසිල්. (සංස්.) (1987). විමලරත්න කුමාරගමගේ එකතු කළ කවි. කොළඹ 3: සුසිල් සිරිවර්ධන ප්‍රකාශන.